# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

පාලි

මූලාශ්‍රය පරිචය හා සාහිත්‍ය විචාරය **PALI – E 1025**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව **:** 10 යි. කාලය **:** පැය 03 යි.

---

### 1 කොටස

1. (අ). **සිංහල අදහස ලියා දක්වන්න.**

දීපඞ්කරස්ස පන භගවතො අපරභාගෙ එකං අසඞ්ඛෙය්‍යං අතික්කමිත්වා කොණ්ඩඤ්ඤො නාම සත්ථා ලොකෙ උදපාදි. තදා බොධිසත්තො විජිතාවී නාම චක්කවත්තී හුත්වා කොටිසතසහස්ස සඞ්ඛස්ස බුද්ධපමුඛස්ස භික්ඛුසංඝස්ස මහාදානං අදාසි. සත්ථා බොධිසත්තං බුද්ධො භවිස්සතීති ව්‍යාකරිත්වා ධම්මං දෙසෙසි. සො සත්ථු ධම්මකථං සුත්වා පබ්බජි. සො තීණි පිටකානි උග්ගහෙත්වා අට්ඨ සමාපත්තියො ච උප්පාදෙත්වා අපරිහීනජ්ඣානො බ්‍රහ්මලොකෙ නිබ්බත්ති. සොපි බුද්ධො වස්සසතසහස්සානි ඨත්වා සබ්බබුද්ධකිච්චානි නිට්ඨාපෙත්වා පරිනිබ්බායි. තස්සාපි භගවතො ධාතුයො න විකිරිංසු සකලජම්බුදීපවාසිනො මනුස්සා සමාගන්ත්වා සත්තයොජනිකසත්තරතනමයං හරිතාලමනොසිලාය මත්තිකාකිච්චං තෙලසප්පීහි උදකකිච්චං කත්වා චෙතියං නිට්ඨාපෙසුං.

(ආ). ඉහත පාඨය නාගර හෝ රෝමන් අකුරෙන් ලියා දක්වන්න.

2. (අ). පහත ගාථා සිංහල අකුරෙන් පිටපත් කරන්න..

(a). ततो पट्ठाय सो सत्था विनेन्तो देवमानुसे,
बोधितो फुस्समासम्हि नवमे पुण्णमासियं॥

(b). लङ्कमागम्म गङ्गाय तीरे योजनवित्थते,
महानागवनुय्याने आयामेन तियोजने॥

(c). यक्खानं समितिं गन्त्वा ठत्वान गगने तहिं।
वातन्धकारवुट्ठिहि कत्वा यक्खे भयद्दिते॥

(d). लद्धाभयेहि यक्खेहि तेहि दिन्नाय भुमिया।
चम्मखण्डं पसारेत्वा निसीदित्वान तङ्खणे॥

(e). चम्मखण्डं पदित्तग्गि जालामालासमाकुलं।
इद्धिया वड्ढयित्वान याव सिन्धुं समन्ततो॥

(ආ). ඉහත ගාථාවල තද කළු අකුරින් මුද්‍රිත පද විවරණය කරන්න.

3. මජ්ඣිමනිකායේ මූලික උපයෝගීතාව පරවාද මර්ථනය බවට බුද්ධඝෝෂ හිමියන් දක්වන මතය පිළිබඳ ඔබගේ අසහස සනිදර්ශනව ගෙනහැර දක්වන්න.

4. පාලි සාහිත්‍ය ධර්ම සාහිත්‍යයක් වුවත් එය විවිධ විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කරන කෘතිවලින් සමන්විත වූවක් බව නිදසුන් මගින් තහවුරු කරන්න.

5. "පාලි මහාවංසය ඉතිහාස කරුණු පමණක් නොව කාව්‍යමය රසාස්වාදයක් ද ලැබිය හැකි ග්‍රන්ථයකි." විමසන්න.

## 2 කොටස

6. පහත දැක්වෙන ගාථාව ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පූජෙමි බුද්ධං කුසුමෙන' නෙන
පුඤ්ඤෙන මෙතෙන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදම්මේ
කායො තථා යාති විනාසභාවං

(අ). ඉහත ගාථාවෙහි ගුරු ලඝු වින්‍යාසය ලියා දක්වන්න.
(ආ). එම ගාථාවෙහි අවසාන පාදයේ ඇතුළත් ගණ නම් කරන්න.
(ඉ). මෙම ගාථාවෙහි ඇතුළත් සුභ හා අසුභ ගණ සංඛ්‍යාව වෙන වෙනම දක්වන්න.
(ඊ). මෙම ගාථාව ආරම්භ වන ගණයට භාවිතා වන අපර නාමය කුමක් ද ?
(උ). මෙම ගාථාව රචනා වී ඇති වෘත්තය නම් කරන්න.

7. පහත දැක්වෙන වෘත්තවලින් හතරක ලක්ෂ්‍ය - ලක්ෂණ දක්වන්න.

(i). උපජාති
(ii). දොධක
(iii). තොටක
(iv). වංසට්ඨ
(v). වසන්තතිලකා
(vi). මාලිනී
(vii). මන්දක්කන්තා
(viii). සද්ධරා

8. ජීවිතාවබෝධය පුළුල් කර ගැනීමට අදාළ කරගත හැකි සාහිත්‍යයක් ලෙස බෞද්ධ ජාතක කථාවන්හි වැදගත්කම නිදසුන් මගින් අනාවරණය කරන්න.

9. සාහිත්‍ය නිර්මාණයක් විචාරය කිරීමේ දී සැලකිය යුතු කරුණු පාලි මූලාශ්‍රය අනුව පෙන්වා දෙන්න.

10. " උදානපාළියේ ආඛ්‍යානමය සූත්‍ර ධර්ම රසයෙන් මෙන්ම සාහිත්‍යමය රසයෙන් සමුපේත වේ." විමසන්න.

*********************